රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 15/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1988 මැයි මස 16 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන් වෙත.

## ඌන අධ්‍යාපන සුදුසුකම් ඇති නිලධාරීන් ඒකාබද්ධ සේවාවල සමාන්තර ශ්‍රේණි වලට අන්තර්ග්‍රහණය කිරීම.

ඔබ අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශය යටතේ වූ, දෙපාර්තමේන්තුවක හෝ දැනට සේවයේ යෙදී සිටින පහත සඳහන් ගණයට අයත්, එනම්,-

(I) මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවූ ද,
(II) ස්ථිර තනතුරක් දරන්නාවූ ද,
(III) අදාල බඳවා ගැනීමේ පරිපාටියෙහි නියමිත පරිදි එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් නැත්තාවූ ද,

සෑම කෙනෙකුම සම්බන්ධයෙන් ඔහුගේ නම, උපන් දිනය, අයත් සේවය සහ/හෝ දරන තනතුර, පත්කිරීමේ බලධාරියාගේ නිල නාමය යන මේ තොරතුරු දැක්වෙන වාර්තාවක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන්න.

02. කරුණාකර මෙම තොරතුරු 1988 ජූනි 30 වැනිදාට පෙර ඔහු වෙත ලැබෙන්නට සලස්වන්න.

(ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන)
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.